# රණවිරු ඇපරල් ඉතිහාසය.

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පැවති යුද්ධය හේතුවෙන් විශාල සොල්දාදුවන් ප්‍රමාණයකගේ ජීවිත අහිමි වුවා සේම තවත් විශාල පිරිසක් විවිධ ශාරීරික ආබාධයන්ට ගොදුරු වූ අතර එම ආබාධිත තත්වයට පත් සෙබළුන් පුනරුත්ථාපනය කර වෘත්තිය පුහුණුවක් ලබා දී සමාජයට වැඩදායි පිරිසක් බවට පත් කිරීමේ අරමුණින් යුතුව මෙම රණවිරු ඇපරල් ආයතනය ආරම්භ කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව විවිධ ශාරීරික ආබාධයන්ට ගොදුරු වූ සොල්දාදුවන් සඳහා මෙවැනි ව්‍යාපෘතියක යෙදවීම තුලින් යුද්ධ හමුදාවට අවශ්‍ය නිල ඇඳුම් නිෂ්පාදනය කිරීමෙන් පිටස්තර ගැණුම් කරුවන් වෙත ලබා දෙනු ලබන මුදල් යුද්ධ හමුදාව තුලම රඳවා ආබාධිත සෙබළුන්ගේ ප්‍රයෝජනය සඳහා යෙදවීම හා ඔවුන් වෙත විධිමත් වෘත්තිය පුහුණුවක් ලබා දී ඔවුන්ගේ අනාගතය සවිමත් කිරීම යෝග්‍ය බව එවකට පුනරුත්ථාපන අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කල බ්‍රිගේඩියර් (වෛද්‍ය) එච්අයිකේ ප්‍රනාන්දු යන ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් හඳුනා ගෙන හා එවකට ඔහුගේ මාණ්ඩලික නිලධාරීත්ව සිටි මේජර් ජීඑම්ජී වික්‍රමනායක - ශ්‍රීලංසිරෙ, කපිතාන් එස්ජේඑන් මහේෂ් කුමාර යන නිලධාරීන් හඳුනාගෙන ඇගළුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කල එවකට මහාචාර්‍ය රෝහණ කුරුප්පු මහතා සමඟද සාකච්ඡා කර ව්‍යාපෘති වාර්ථාවක් සකස් කර, එවකට යුධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ජීඑච් ද සිල්වා ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී මහතාගේ මූලික අනුමැතිය 1993 දී පුනරුත්තාපන අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ලබා දෙන ලදී. ඒ අනුව තෝරා ගත් ආබාධිත සෙබළුන් 40 දෙනෙකු පළමු අදියරේ පුහුණු කටයුතු සඳහා ට්‍රයි-ස්ටාර් ඇපරල් කර්මාන්ත ශාලාව ඇතුළු කර්මාන්ත ශාලා කිහිපයක් වෙත යොමු කරන ලදී.

එවකට ඇගළුම් ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණයන් වන විශ්‍රාමික ලුතිතන් කර්නල් යූ ගජනායක, ඩීජීඑච් ඉසුරි ධර්මරත්න මහත්මිය හා මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රවීණයන් වන ඩබ්ලිව්පී සමරසිංහ , යෝහිණී තේවතාසන් මෙනෙවිය සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ උපදෙස් මත රණවිරු ඇපරල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා මේජර් ජීඑම්ජී වික්‍රමනායක - ශ්‍රීලංසිරෙ යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 'නිලධාරී අණදෙන' වශයෙන් පත් කිරීම් සිදු කරන ලදී.

රණවිරු ඇපරල් කර්මාන්ත ශාලාව ස්ථාපිත කිරීම සඳහා භූමියක අවශ්‍යතාව පැන නැගුනු අතර, ඒ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී පණ්ඩු බණ්ඩාරනායක මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ යක්කල ප්‍රදේශයේ දානපතියකු වූ ඩේවිඩ් මෙරික් පීරිස් මහතා විසින් ඉඩම් අක්කර 05 ක ප්‍රමාණයක් නොමිලේ පරිත්‍යාග කළ අතර, තවත් අක්කර 05 ක ප්‍රමාණයක් රුපියල් මිලියන 1. 5 ක් වැනි අඩු මුදලකට යුද හමුදාව වෙත ලබා දීමටත් එකඟ වන ලදී. ඒ අනුව යක්කල දඹුවවත්ත ප්‍රදේශයේ අක්කල 10ක භූමි භාගයක් රණවිරු ඇපරල් කර්මාන්ත ශාලාව ඉදි කිරීම සඳහා ලබාගෙන එම මැතිතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් 1996 මාර්තු මස 27 දින කර්මාන්ත ශාලාව සඳහා මුල් ගල තබන ලදී. එදිනම ඉඩම පරිත්‍යාග කල ඩේවිඩ් මෙරික් පීරිස් මහතාට කෘතගුණ සැලකීමක් වශයෙන් රණවිරු ඇපරල් වෙත පිවිසෙන මාර්ගය 'ඩේවිඩ් මෙරික් පීරිස් මාවත' නමින් නම් කරන ලදී.

1997.08.23 වන දින විවිධ ශාරීරික ආබාධයන්ට ගොදුරු වූ නිලධාරීන් 04 දෙනෙකු සහ සොල්දාදුවන් 90 දෙනෙකුගේ දායකත්වයෙන් යුතුව කිසිදු මූලික පහසුකමක් නොමැතිව මහන මැෂින් 25 ක් උපයෝගි කර ගනිමින් සෙසුනිල තේවාසිකාගාරය තුල නිෂ්පාදන කටයුතු ප්‍රථම වරට ආරම්භ කරන ලදී. මීට සමගාමීව කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනයට අවශ්‍ය මූලික මිනිස් සම්පත මත යුධ හමුදා ආබාධිත සොල්දාදුවන්ගෙන් තෝරාගෙන ඔවුන් ඇගළුම් ක්ෂේත්‍රය පිළිබඳව මූලික පුහුණුව ට්‍රයි-ස්ටාර් ඇපරල් ආයතනයෙන් හා රත්මලාන රාජ්‍ය ඇගළුම් අභ්‍යාස ආයතනයෙන්ද ඉටු කර ගන්නා ලද අතර, කර්මාන්ත ශාලාව ඉදිකර මූලික යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය රාජ්‍ය ආරක්ෂක මුදලින් ලද පරිත්‍යාගයෙන් සහ යුධ හමුදාවේ සියළුම සාමාජිකයින්ගේ දිනක වැටුප පරිත්‍යාගයෙන් මෙන්ම ශ්‍රී ලංකාවේ ඇගළුම් අපනයන කරන්නන්ගේ සංගම් වලින් ලද මුදලින් අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගෙන 1998.12.10 දින මැෂින් 264 කින් සහ ක්‍රියාන්විත රාජකාරියේදී

විවිධ ශාරීරික අපහසුතාවයන්ට පත් නිලධාරී හා සෙසු නිලයින් 500 ක කාර්ය මණ්ඩලයකින් යුතුව නිල වශයෙන් විවෘත කරන ලදී. නව කර්මාන්ත ශාලාව විවෘත කිරීම සඳහා එවකට සිටි යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරල් ආර් ද එස් දළුවත්ත ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එල්ඕඑම් එන්ඩීසී පීඑස්සී මැතිතුමාගේ ආරාධනය පරිදි එවකට වාරිමාර්ග විදුලි බල හා බලශක්ති අමාත්‍ය හා රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා අතින් නිෂ්පාදන කටයුතු නිල මට්ටමින් ආරම්භ විය. මෙම අවස්ථාව සඳහා හිටපු යුධ හමුදාපති ලුතිනන් ජෙනරල් ආර් ද එස් දළුවත්ත ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එල්ඕඑම් එන්ඩීසී පීඑස්සී මැතිතුමාගේ සහභාගීත්වයෙන් සිදු විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික නිල ඇඳුම් අවශ්‍යතාවය මෙම ව්‍යාපෘතිය මගින් ලබා දීමේ අරමුණින් යුතුව නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා අලව්ව තෙළුම්දෙනිය ප්‍රදේශයේ පැවති බෝයගනේ ඇපරල් නමින් වූ කර්මාන්තශාලාව ආබාධිත සෙබළුන් විසින් ඇගළුම් නිෂ්පාදනය කර උපයාගත් මුදලින් 2009 ඔක්තෝම්බර් මස 23 වන දින රුපියල් .මිලියන 55. 5 ක මුදලක් වැය කර සියළුම යන්ත්‍රෝපකරණ මිලදී ගෙන රණවිරු ඇපරල් අලව්ව නමින් 2010 ජනවාරි මස 17 වන දින නිල වශයෙන් ආරම්භ කරන ලදි .

මෙම රණවිරු ඇපරල් ව්‍යාපෘතිය සීඝ්‍ර සංවර්ධනයක් කරා ගමන් කිරීමේ නියමුවන වන්නේ මෙතෙක් රණවිරු ඇපරල් කර්මාන්ත ශාලාවේ සභාපතිවරුන් වශයෙන් කටයුතු කල යුධ හමුදාවේ සියළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අධ්‍යක්ෂකවරුන් ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ නිලධාරිවරුන් සහ රණවිරු ඇපරල් ආරම්භයේ සිට මේ දක්වා කළමණාකරණ මණ්ඩලයේ සිවිල් අධ්‍යක්ෂකවරුන් ලෙස ස්වේච්ඡාවෙන් කටයුතු කල මහත්ම මහත්මීන් වේ. තවද මෙම ආයතනය ආරම්භයේ සිට මේ දක්වා තම ශ්‍රම දායකත්වය සැපයූ සියළුම නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ කැපවීම වර්ථමාන තත්වය දක්වා ගමන් කිරීමට ඉවහල් විය.

මෙම කර්මාන්ත ශාලා දෙක මෙහෙයවනු ලබන ප්‍රධාන විධායක නිලධාරී (සේනාවිධායක) ගේ මග පෙන්වීම මත, ඇගළුම් ක්ෂේත්‍රයට ආවේනික නවීන තාක්ෂණයෙන් හා ක්‍රම උපායන් උපයෝගී කර ගනිමින් ගුණාත්මක භාවයෙන් යුතු උසස් නිල ඇඳුම් නිෂ්පාදනය කරන අතර මේ වන විට යුධ හමුදාවේ නිල ඇඳුම් අවශ්‍යතාවයෙන් 60% සපයනු ලබයි.